මහරගම නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුලි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | ලියනගොඩ නිදහස් ආයුර්වේදයේ ආරම්භක තොග ශේෂය, ඖෂධ මිලදීගැනීම් සහ නිකුත් කිරීම් ගිණුම්ගත නොකිරීම නිසා සැපයුම් හා උපකරණ ගිණුම රු.48,554 කින්, ආදායම් ආධාර ගිණුම රු.46,761 කින් හා අවසාන තොග ශේෂය රු.479,581 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතු වේ. | පිළිගනිමි. ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇත. |
| (ii) | අවසාන තොග ශේෂයට ඉන්ධන තොගය වු රු.282,699 ක් හා කර්මාන්ත භාණ්ඩ තොගය වු රු.458,673 ක් ගැලපුම් නොකිරීම නිසා තොග ශේෂය රු.741,372 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම් කල යුතු වේ. | පිළිගනිමි. කර්මාන්ත තොග ශේෂය තොග ශේෂයට ගලපා ඇත. උපලේඛනයට ඇතුළත් කර ඇත. එකතුව ගැනීම පමණක් මගහැරී ඇත. |
| (iii) | මුද්දර ගාස්තු වලින් අයකිරීමේ පදනම මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2018 වර්ෂයේ ලබා ගත් රු.29,384,000 ක් වටිනා කම්පැක්ටර් 02 සඳහා වර්ෂයට අදාළ ප්‍රාග්ධන වැය ලෙස රු.7,108,250 ක් | ස්ථාවර වත්කම් නිවරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම් ගත විය යුතු වුවද මුළු වටිනාකමම ප්රාග්ධන වැය ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.22,275,750 කින් ප්‍රාග්ධන වැය වැඩියෙන් පෙන්වා තිබුණි. | | |
| (iv) | මුද්දර ගාස්තු වලින් අය කළ මුළු වටිනාකම වූ රු.8,477,000 ක් වෙනුවට පළාත් සභා ණය ගිණුම සහ අයකර ගත හැකි උපයෝගිතා සේවා ගිණුම ගැලපීමේදී රු.8,122,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.355,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ජ’නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (v) | ණය පදනම මත ලබාගත් රු.29,384,000 ක් වටිනා කම්පැක්ටර් 02 ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර නොකර පොදු ගබඩා ගිණුමට බැර කිරීම නිසා තොග ශේෂය එම වටිනාකමින් අඩු වී තිබුණි. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ජ’නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (vi) | 2017 වර්ෂයේ ණය පදනම මත ලබා ගත් ට්‍රැක්ටර් 02 ක් සහ ට්‍රේලර් 02 ක් වෙනුවෙන් අයකල මුද්දර ගාස්තු රු.1,368,750 ක මුදල ගිණුම්ගත නොකිරීම නිසා මෝටර් රථ ගිණුම, ප්‍රාග්ධන වැය ගිණුම, හිඟහිටි මුද්දර ගාස්තු ගිණුම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් පෙන්වා තිබුණි. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ජ’නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (vii) | විදුලි පෞද්ගලික සමාගමේ කොටස් ආයෝජනය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයට අදාළව ලැබුණු රු.3,364,200 ක ලාභාංශ මුදල වෙනත් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට කොටස් ආයෝජන ගිණුම බැර කිරීම හේතුවෙන් ආයෝජන ගිණුම අඩුවෙන්ද ඌනතාවය වැඩියෙන්ද පෙන්වා තිබුණි. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ජ’නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (viii) | කසල ප්‍රවාහනය සඳහා පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.1,304,376 ක මුදල ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් ණයහිමියන් ලෙස ගිණුම්ගත කල යුතුවේ. | කසළ ප්‍රවාහනයේ කොටසක් පුද්ගලික ආයතනයකට ලබා දී තිබූ අතර එම ආයතනයට සභාව විසින් ගෙවිය යුතු මුදලක් හා එම ආයතනය විසින් සභාවට ගෙවිය යුතු මුදලක් හිලව් කර ඇත. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (ix) 2018 වර්ෂයේ ලද පෙර වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,380,519 ක් ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ගිණුමට බැර නොකිරීම නිසා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී එම වටිනාකමින් වැඩියෙන් පෙන්වා තිබුණි. | ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් **10** කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු. 15,687,855 ක් වැඩියෙන් හා රු.10,121,317 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පිළිගනිමි. උපලේඛන හා ගැලපිම් ඉදිරියේදී කරනු ඇත. |

| | | |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.55,249,396 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන හෝ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතුවේ. | දක්වා ඇති සියලු ගිණුම් උපලේඛන හා ගැලපීම් සිදු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) නගර සහා ආඥා පනතේ (255 අධිකාරය)165 වගන්තියේ "ඇ" උපවගන්තිය | ඇස්තමේන්තු වටිනාකම හා ඉඩම් කොටස්වල සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස සසඳා එම වෙනස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නගර සහා ආඥා පනතේ (255 අධිකාරය)165 වගන්තියේ "ඇ" උපවගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉඩම් විකුණුම් 17 හි ඇස්තමේන්තු වටිනාකම හා ඉතිරි කොටස් වල සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස ගෙවන කාලය දන්වමින් ලිපි යවා ඇත. ඉදිරියේදී කිරීමට කටයුතු කරමි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| XXIV පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | සේවක ණය අයකරගත නොහැකි විට ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | XXIV පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. අයවිය යුතු පුද්ගලයින් වෙත ලිපි යවා ඇත. ණය අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මු.රෙ. 188 (2) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.9,325 ක් වටිනා චෙක්පතක් හා මුදල් ඇණවුම් 03 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 188 (2) ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.3000 ක චෙක්පත මැයි මස බැංකු සැසඳුමෙන් නිරවුල් වේ. මුදල් ඇණවුම් රු. 6,488 විසදීම |

| | | | |
|---|---|---|---|
| | | | සඳහා කටයුතු කරමින් පවතී. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති චක්‍රලේඛයේ 2 II හා V වගන්ති | ක්ෂේත්‍ර නිලධාරින් කාර්යාලයට වාර්තා කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම පිටවීම සනාථ කර නොතිබුණි. | අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | චක්‍රලේඛයේ 2 ii හා v වගන්ති මේ වන විට ක්ෂේත්‍ර නිලධාරින් නිසි පරිදි සතියේ නියමිත දින දෙක ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සනාථ කිරීමට කටයුතු කර ඇත. |

(ඉ) වෙනත් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) 2012 ජුලි 11 දිනැති අංක WP/LGD /01/2012 දරන චක්‍රලේඛයේ XXI ඡේදය | අනවසර ඉදිකිරීමේ හා ගොඩකිරීම් ආදිය සම්බන්ධව සැලසුම් කමිටුවේ ගනු ලැබූ තීරණ පිළිබඳ ත්‍රෛමාසික වාර්තාවක් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කොමසාරිස්ගේ (බ.ප.) 2012 ජුලි 11 දිනැති අංක WP/LGD /01/2012 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. මේ වන විට පළාත් පාලන කොමසාරිස් වෙත ත්‍රෛමාසික වාර්ථා යැවීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 62,788,166 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.192,717,964 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

| **නිරීක්ෂණ** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| **අංක** 607629 දරන ජංගම ගිණුම 2015 අගෝස්තු මාසයේ දී වසා තිබුණද මුදල් යටතේ රු.2,052,258 ක නාමික වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුමේ දක්වා තිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | මෙම ගිණුමේ විසඳිය නොහැකි ගැටළු කිහිපයක් පවතින බැවින් ඒ පිළිබඳ පරීක්ෂණ වාර්තාව ගිණුම් කාරක සභාවට යොමුකිරීම සඳහා ඉදිරිපත් කර ඇත. එහි ඉතිරි ශේෂය කපාහැරීම සඳහා ඉදිරියේදි කටයුතු කරමින් පවතී. |

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ඇස්තමේන්තු ගත ආදායම (රු). '000 | බිල්කළ ආදායම (රු). '000 | රැස්කළ ආදායම (රු). '000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). '000 | ඇස්තමේන්තු ගත ආදායම (රු). '000 | බිල්කළ ආදායම් (රු). '000 | රැස්කළ ආදායම (රු). '000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). '000 |
| වරිපනම් හා බදු | 102,506 | 109,778 | 109,821 | 61,387 | 95,506 | 87,236 | 70,300 | 54,627 |
| කුලී | 21,167 | 26,334 | 25,012 | 4,487 | 19,206 | 7,399 | 5,254 | 2,145 |
| බලපත්‍ර ගාස්තු | 1,203 | - | 1,602 | - | 1,602 | - | 1,226 | - |
| වෙනත් ආදායම් | 260,565 | - | 31,834 | - | 257,780 | - | 368,753 | - |

2.3.2. **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම් රු.89,080,916 ක් වුවද ඉන් රු.21,010,791 ක් හෙවත් සියයට 23 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වාර්ෂික බිල්කිරීම් අය කර ගැනීමට නොපමාව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. මේ වන විට අදාල බදු මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇති අතර ඒ අනුව එම අයකර ගැනීම් ද සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.61,996,522 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.21,329,019 ක් අයකරගෙන තිබූ බැවින් රු.40,667,503 ක් හෙවත් සියයට 66 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අය කර ගැනීමට නොපමාව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. එම හිඟ මුදල් අයකර ගැනීමට මේ වන විට ක්‍රියා මාර්ග ගෙන ඇත. |
| (ඇ) | ව්‍යාපාර බදු ශේෂය රු.267,685 ක් වුවද ඉන් රු.201,685 ක් හෙවත් සියයට 75 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ව්‍යාපාර බදු ශේෂය අය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. 2018-12-31 දිනට ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. |

**2.3.3 කුලී**

------

| | | | |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 161 කින් රු. 4,422,994 ක මුදලක් අයවීමට තිබූ අතර එය මාස 01 සිට මාස 74 දක්වා පරාසයක විය. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. හිඟයෙන් 26.2% ක් හා ලිපිගොනු 50 ක් නීතිඥ වෙත යොමු කර ඇත. නීතිඥ මහතා වෙත සිහිකැඳවීම් ද යවා ඇති අතර හිඟ ලේඛනය අනුව අයකර ගැනීමට ලිපි සකසමින් පවතී. |
| (ආ) | නගර සභාවට අයත් කඩකාමර 17 කට අදාල ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. එම ගිවිසුම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | ගිවිසුම් හෝ තක්සේරු වාර්තා අනුව නියමිත කාලසීමාව අවසානයේ නව ගිවිසුම් අත්සන් කළයුතු වුවද කඩකාමර 100 ක ගිවිසුම් අළුත් කර නොතිබුණි. | නොපමාව ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. පවතින තක්සේරුවට අදාලව ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. මේ වන විට යාවත්කාලීන කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්යසාධනය**

--------------

**(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

--------------------

| | | | |
|---|---|---|---|
| (i) | විමධ්‍යගත ආධාර යටතේ ක්‍රියාත්මක කළයුතු රු.1,300,000 ක් වටිනා ව්‍යාපෘති 06 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරීම යන හේතුව දක්වමින් අවලංගු කර තිබුණි. | සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | පළාත් සභා ආධාර යටතේ ක්‍රියාත්මක කළයුතු රු.17,650,000 ක් වටිනා ව්‍යාපෘති 16 ක් වෙනත් ව්‍යාපෘතියකට | සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | අරමුදල් මාරු කිරීම යන හේතුව දක්වමින් අවලංගු කර තිබුණි. | | |
| (iii) | සුචිත පුරවර ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළයුතු රු.912,958 ක් වටිනා ව්‍යාපෘතියක් මාර්ග ආරවුල් යන හේතුව දක්වමින් අවලංගු කර තිබුණි. | විධිමත් විමර්ශණයක් සිදුකර ගැටලු විසදා ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. |
| **(ආ)** | **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**<br>----------------------------------- | | |
| (i) | පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ රු. 40,945,740 ක් වටිනා ව්‍යාපෘති 53 ක් කාලගුණික හේතු, ගිවිසුම්ගත වීමේ ප්‍රමාදය හා ප්‍රතිපාදන නොමැති වීම ආදිය හේතුවෙන් වැඩ අවසන් කර නොතිබුණි. | ඉතිරි ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කල යුතුවේ. | ව්‍යාපෘති 31 ක් ඉටු කර ඇත. |
| (ii) | පැපිලියාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2012 සිට 2018 වර්ෂය දක්වා පළාත් සභා අරමුදලින් හා සභා අරමුදලින් රු. 17,795,849 ක් වැය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සංවර්ධන කටයුතු අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | මහජනතාවට විවෘතව ඇත. |
| (ඇ) | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**<br>----------------------------------- | | |
| (i) | 2018 වර්ෂය තුළ වෙන්කරන ලද කසළ ටොන් 4602 ක් හා වෙන් නොකරන ලද කසළ ටොන් 32028 ක් කරදියාන කසළ අංගනයට භාරදී තිබුණු අතර වෙන්කරන ලද කසළ ප්‍රමාණය වෙන් නොකරන ලද කසළ ප්‍රමාණයෙන් සියයට 14.36 ක් විය. කසළ එකතු කිරිම නිසි පරිදි කළමනාකරණය නොකිරිම නිසා රු.24,020,737 ක් වැඩිපුර ගෙවීමට සිදු ව තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කල යුතුවේ. | පිළිගනිමි. මේ වන විට කසළ කළමනාකරණය සඳහා පියවර ගෙන ඇත. |
| (ii) | කසළ ප්‍රවාහනය සඳහා සභාවට අයත් වාහන 31 ක් හා රියදුරන් 26 ක් සභාව සතුව තිබියදී පෞද්ගලික ආයතනයකින් ප්‍රවාහන සේවා ලබා ගැනීම වෙනුවෙන් 2018 වර්ෂය තුළ රු.3,260,940 ක් ගෙවා තිබුණි. | කසළ ප්‍රවාහන වියදම් අවම කර ගත යුතුවේ. | පිළිගනිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | | |
|---|---|---|---|
| (අ) | ගනුදෙනුකරුවන් විසින් වරිපනම් ගෙවීම සඳහා ලබා දී තිබූ රු.62,159 ක් වටිනා චෙක්පත් 06 ක් හා දැන්වීම් පුවරු ගාස්තු වෙනුවෙන් ලබා දී තිබූ රු.212,472 ක් වටිනා චෙක්පත් 03 ක් අගරු වී තිබුණ ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් වලින් මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අගරු චෙක්පත් සඳහා නඩු පැවරීමට සභා නීතිඥ වෙත යොමු කර ඇත. |
| (ආ) | පොලිය නැවත ආයෝජනය කරන ස්ථාවර තැන්පතු 05 ක් සඳහා ප්‍රවර්තන වර්ෂයට අදාල පොලිය ගැලපීම් නොකිරීම හේතුවෙන් ස්ථාවර තැන්පත් වටිනාකම රු.3,985,767 කින් අඩු වී තිබුණි. | පොලිය නැවත ආයෝජනය කල යුතුවේ. | පිළිගනිමි. ජ'නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි 2008-2020 හි 14(1) අ උපවගන්තිය අනුව අයදුම්පත්‍රය ලියාපදිංචි කල දින සිට සති 08 ක් ඇතුළත සැලසුම් අනුමත කළයුතු වුවද 2017 හා 2018 වර්ෂවලට අදාලව අවස්ථා 148 කදී දින 108 සිට දින 706 දක්වා සැලසුම් අනුමත කිරීමේ කාලප්‍රමාදයක් සිදු වී තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 52 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු පිරවීමට දන්වා ඇත. |

(ආ) **සේවක ණය**

| | | | |
|---|---|---|---|
| **(i)** | ස්ථාන මාරු වී ගොස් මාස 24 සිට මාස 144 ක කාලයක් ගත වූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.285,728 ක ණය මුදල් අයකරගෙන නොතිබුණි. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2018.12.31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මේවන විට වාරික වශයෙන් අය කරණු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මියගිය/සේවය හැරගිය/විශ්‍රාම ගිය නිලධාරීන් 42 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,074,375 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉන් රු.299,970 ක් අයකර ඇත. ඉතිරිය ඉදිරි කාලයේදි අයකර ගැනිමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

| | | | |
|---|---|---|---|
| (අ) | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරුකර වරිපනම් බදු අයකිරීම කළ යුතු වුවද 2008 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි. | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරුකල යුතුවේ. | මේ වන විට තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සිදු කර ගෙන යනු ලබන අතර එම කටයුතු 95% කින් අවසන් වී ඇත. 2020 ජනවාරි සිට නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| (ආ) | බදු ගිවිසුම අනුව බදුකරු මාස 06 කට අධික කාලයක් කුලී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් කුලී ගිවිසුම ඒකපාර්ශිකව අවලංගු කිරීමේ බලය නගර සභාව සතු වුවත් මාස 06 සිට මාස 97 ක් දක්වා කුලී ප්‍රමාද වූ කඩ කාමරවල කුලී ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලී ගිවිසුම් අනුව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. වර්තමානයෙදි හිඟ පවතින කඩ කාමර සඳහා හිඟ මුදල් ගෙවීම් කරන ලෙස දන්වමින් ලිපි යැවීම සිදුකරයි. පවතින හිඟ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ලිපි ගොණු නිතිඥ වෙත යොමු කරණු ලැබේ. |
| (ඇ) | ඇස්තරක්ක මගින් වරිපනම් අංක ලබා ගැනිම හෝ නම වෙනස් කිරිමේදී පුරවැසි ප්‍රඥප්තිය අනුව සති 02 ක් තුල නිමකල යුතු වුවද දින 05 සිට දින 124 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය අනුව ක්‍රියා කිරිමට හැකි සෑම විටම කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. එසෙ ප්‍රමාදයන් සිදුවිමට ප්‍රායෝගික ගැටලු ඇත. ප්‍රමාදයන් අවම කර ගැනීමට පියවර ගනිමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරිම

| | | |
|---|---|---|
| නගර සභාව විසින් ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් නඩත්තු කර නොතිබු අතර ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත්ව පවත්වාගෙන නොතිබුණි. | ලේඛන විධිමත්ව යාවත්කාලින කල යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් පවත්වාගෙන යනු ලැබූවත්, එය විගණනය විසින් පෙන්වා දුන් ආකෘතියට අනුව නොමැති බව පිළිගනිමි. එම තොරතුරු ඇතුළත් කර , අපේක්ෂිත මට්ටමේ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි.<br>ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන ගොස් නොමැති බව පිළිගනිමි. විගණනය විසින් පෙන්වා දුන් අඩුපාඩුව සකස් කර ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

#### 3.5.2 පවරා නොගත් වත්කම්

| | | |
|---|---|---|
| හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් 2002 වර්ෂයේ මහරගම නගර සභාවට ලබාදී තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ට්‍රැක්ටර් 02 ක් සහ ට්‍රේලරයක් සභාවට පවරාගෙන නොතිබුණි. | වාහන නගර සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. හෝමගම ප්‍රාදේශීය සභාව මගින් 2001 වර්ෂයේ මහරගම නගර සභාවට ලබා දී ඇති ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ට්‍රැක්ටර් රථ හා ට්‍රේලරයට මෙම සභාවට පවරා ගැනීමට කිහිපවරක් ලිපි යවා ඇත. |

#### 3.5.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| | | |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව අතිරික්තතා/ ඌනතා විධිමත් පරිදි සටහන් කර ඒ පිළිබඳ අවසාන වාර්තාවක් හෝ තොග ශේෂ ගැලපීමක් සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයට අනුව අතිරික්තතා/ ඌනතා පිළිබඳ අවසාන වාර්තාවක් නිකුත් කල යුතුවේ. | පිළිගනිමි.විගණනය විසින් පෙන්වා දුන් පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

### 3.6 හඳුනාගත් පාඩු

| | | | |
|---|---|---|---|
| (අ) | 2010 සිට 2018 දක්වා වූ කාලසීමාව තුළ සාමාජිකයන් 119 කට නිකුත් කළ රු.57,006 ක් වටිනා පුස්තකාල පොත් 199 ක් ආපසු භාරදී නොතිබුණි. | පුස්තකාල පොත් ලබා ගැනීමට හෝ පාඩු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ සාමාජිකයින් වෙත දැනුම්දීම තුළින් පසුගිය වර්ෂයට වඩා වැඩි පොත් ප්‍රමාණයක් ආපසු භාර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | සභාව සතු වාහනයක් 2017 නොවැම්බර් 03 දින අනතුරකට ලක් වී තිබූ අතර ප්‍රාරම්භක වාර්තාව අනුව එහි අලාභයේ ඇස්තමේන්තු වටිනාකම වූ රු.500,000 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී එවකට මෙම ප්‍රශ්නයේ වර්තමාන තත්වය ගිණුම් ප්‍රතිපත්තිවල වල සටහන් යොදන බව දන්වමි. |

## 4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | | |
|---|---|---|
| අයවැයගත ප්‍රතිපාදන රු.32,833,000 ක් වූ ආදායම් ශීර්ෂ 10 කින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර රු.45,264,000 ක් වූ වියදම් ශීර්ෂ 141 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි | අයවැයගත ප්‍රතිපාදන අනුව උපරිම ඉලක්ක කරා ලගාවිය යුතුවේ. | පිළිගනිමි. නිම් ඇඳුම් වෙළඳපොලක් හා මහල් නිවාස සංකීර්ණයක් සැදීමට තීරණය කළත් එම ව්‍යාපෘතිය ඉටු කිරීමට නොහැකිවීම හේතුවෙන් රු. කෝටි 3ක් උපයා ගැනීමට නොහැකි විය. එසේම රක්ෂණ වන්දි ලැබේ යැයි අපේක්ෂා කලද එම අය ශීර්ෂ වලින් ද මුදල් උපයා ගත නොහැකි විය. එම වැය ශීර්ෂ අයවැය ලේඛනයෙන් ඉවත් කළහොත් නැවත වැය ශීර්ෂයක් ඇති කළ නොහැකි බැවින් කුඩා අගයක් තබා ඇස්තමේන්තු කර ඇත. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| | | |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශයේ පරමාර්ථ හා කාර්යයන් ඉටුකරගත හැකි පරිදි කටයුතු විධිමත්ව සංවිධානයකර නොතිබුණු අතර ආයතනයේ මුදල් හා පරිපාලන කටයුතුවලින් නිදහස් වූ ඒකකයක් ලෙස ක්‍රියා කිරීමටත් අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමටත් කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශය ස්වාධිනව ස්ථාපිත කල යුතුවේ. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ඉදිරි කාලය වෙනුවෙන් අභ්‍යන්තර විගණන වාර්ථා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| | | |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/1 දරන චක්‍රලේඛයේ 06 ජේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත් 2018 වර්ෂය සඳහා රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛයේ 06 ජේදය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අදාල වර්ෂය තුළ වරින් වර ස්ථාන මාරු සිදුවූ බැවින් නිසි පරිදි එම කාර්යය ඉටු කර ගැනීමට නොහැකි වුවත් ඉදිරි කාලය තුළ එම කමිටුව පැවැත්වීමට කටයුතු කරමි. |